# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/09 – 2022 ජූලි මස 19 වැනි අඟහරුවාදා – 2022.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 123 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2019/HW/395.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DSB/LND/03/F1/35- XXXV.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය,

2022 ජූනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ කහවත්ත ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක H/BLA/2019/670 හා 2019.11.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කැබැලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – ගොඩඉරිකොන්ද – ප්‍රමාණය: හෙක්. 0.0080**

උතුරට: ඩී. රාමසිංහ හිමිකම් කියන ගොඩඉරිකොන්ද; නැගෙනහිරට: අ. ග. පි. 291 හි කැබලි අංක 898; දකුණට: අ. ග. පි. 291 හි කැබලි අංක 898; බටහිරට: ඩී. රාමසිංහ හිමිකම් කියන ගොඩඉරිකොන්ද.

02. **කැබලි අක්ෂර 'B' – අලහේන්පිට්ටෙන්නවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0052**

උතුරට: අ. ග. පි. 291 හි කැබලි අංක 866 සහ 863; නැගෙනහිරට: අ. ග. පි. 291 හි කැබලි අංක 864 සහ 863; දකුණට: අ. ග. පි. 291 හි කැබලි අංක 863 සහ 862; බටහිරට: සී. කේ. රණසිංහ හිමිකම් කියන අලහේන්පිට්ටෙන්නවත්ත.

EOG 07-0084